
නව සහනාධාර වැඩ පිළිවෙල

# ඔබේ ගෙවත්තටත් පලතුරු

ලෞකික සැප සම්පත් කෙරෙහි කලකිරී, විමුක්තිය සොයා වන ගත වූ අප්‍රමාණ තවුසයාට, එකම සරණ වූ පලතුරු මිනිස් ශිෂ්ඨාචාර යත් සමග ඇත්තේ වෙන්කළ නො හැකි සබඳතාවයකි. එනිසා දෝ මේ සම්බන්ධයේ ස්වරූපය මිනිස් වර්ගයාගේ ශිෂ්ඨාචාරය පෙන්වන සාධකයක් සේ සමහර මානව විද්‍යාඥයින් සලකනවා. අපේ ජන ජීවිතයේ වුවද සෑම උත්සවයක්ම සාඩම්බර අමුත්තෙක් බවට මෙය පත්වී ඇත.



ආචාර්ය හේරත්

පලතුරුගස් කීපයක් නැති ගෙවත්ත ගෙවත්තක් නොවේ යන්න ස්ථාපිත වූ පැරණි කියමනක්. එහෙත් මෑත දී සිට පලතුරු පිළිබඳව අපේ ජනතාවගේ උනන්දුව හා කතා බහ වැඩි වුනා. ''ඒ මිළයට ගත නොහැකි දුලබ දෙයක් ලෙස පලතුරු දැන් සුබෝපභෝගී වෙලා'' යැයි සමහර පාරිභෝගිකයන්ගෙන් මැසිවිලි නැහේ.

අපේ රටේ පලතුරුවල හිඟයක් ඇති වී තිබේනම් එය ඓතිහාසික ක්‍රියා වලියක ප්‍රතිඵලයක් ලෙසයි උද්‍යාණ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රිය බලධාරියකු වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (උද්‍යාන විද්‍යා) ආචාර්ය එඩී හේරත් දකිනුයේ මේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස එළවළු විසිතුරු පලවර්ග හා පලතුරු යන සර්ම කලාපීය උද්‍යාන විද්‍යාවේ ප්‍රධාන කොටස් තුනක් අඩු වර ප්‍රසාද ලැබෙන්නේ පලතුරුවලට.

මෙලස සිදු වූයේ ඇයි? යන ප්‍රශ්ණයට පිළිතුරු දෙන ආචාර්ය හේරත් මෙය අපේ රටේ පැවති විදේශ පාලනයේ අතුරු පලයක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් යටත් විජිතවල වගාවන් කළේ ඔවුන්ගේ පාලන ක්‍රමයේම කොටසක් ලෙසයි. වෙනත් වචනවලින් කිව හොත් ඔවුන් යටත් කරගෙන ඒ ඒ රටවලට විශේෂ වූ වැවිල්ලක් තිබුනා. ඒ අනුව අපේ රරටට නියම වූ වැවිලි වූයේ තේ, රබර්, පොල්. නිදහසින් පසුව වුවද අපේ කෘෂිකාර්මික පර්යේෂණ යොමු වුනේ ප්‍රධාන ආහාරය වන සහල් නිපදවීමට. අපේ සම්පත් ප්‍රමාණය ඉතා අඩු නිසා සහල් නිෂ්පාදනය වැඩි කිරිමට එම සම්පත් යෙදවීම ජාතික ප්‍රමුඛ තාවයක් වුනා.

අනෙක් අතින් පලතුරු නිෂ්පාදනය වැඩි කිරීමට නව පර්යේෂණ කලත් ගසෙහි ආයු කාලය වැඩි නිසා සෑහෙන කාලයක් ගත වෙනවා. නොඑසේව, එළවළු හා විසිතුරු පැලෑටි වල දියුණුවත්, විශේෂ හේතූන් නිසා අපේ රටේ ඇතිවී, තමන්ට පලපුරුදු—සෞම්‍ය කලාපීය එළවළු—ගෝවා, බීට්රූට්, කැරට්—වතුකරයේ වවා ගැනීමට උත්සුක වූ බ්‍රිතාන්‍යයන් ගෙන් ශිල්ප ඥානය ලබාගත් අපේ උඩරට ගොවියන් ඒවා වගාව ඇරඹීම මෙම දියුණුවට අඩිතාලමයි.

එහෙත් පලතුරු වගාවට මෙබඳු ශිල්ප ඥානයක් නොලැබීම නිසා අපේ ගොවීන්ට සිදුවූයේ සම්ප්‍රදායිකව වගාකළ පලතුරුම වගා කරන්නටයි. මේ දැනුම




පරතරය පල තුරු වගාව සම් ප්‍රදයික ගෙවතු වගාවන්ට සීමා කිරීමට හේතුවූනා.

කෙසේ වුවද පලතුරු නිෂ්පාදන යට වෙළඳ පොලේ ඉතා යහපත් අනාගතයක් තිබෙනව. මෙය තේරුම් ගත් කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ උද්‍යාණ විද්‍යා අංශය සකස් කළා නව වැඩ පිළිවෙලක්. ඒ පිළිබඳව ආචාර්ය හේරත්; අපේ වැඩ පිළිවෙලේ මූලික අර මුණ හොඳ පලතුරු අපේ රටේ සුලභ කිරීම, එහෙත් එයින් අදහස් කෙරෙන්නේ ද අප විදේශ වෙළඳ පොල අමතක කළයුතු බවකි,

නියත ලෙස ම, අප විදේශ වෙළඳ පොල සඳහා එක් මූලික දුෂ්කරතාවයක් ජයගත යුතුය. ඒ විදේශ වෙළඳ පොලට සරිලන ආකාරයට අපේ පලතුරු නිෂ්පාදන තත්ත්වය උසස් කිරීම, උදහරණ යක්: අපේ සම්ප්‍රදයික පැහිරි වර්ගයේ (දෙහි දෙඩම් පවුල් වලට අයිති) පළතුරු තත්ත්වයෙන් බාලයි. දැන් අපේ රටේ තිබෙන එම තත්ත්වයේ පළතුරු වලට විදේශ වෙළඳ පොලේ ඉල්ලුමක් නෑ. (ඒ වෙළඳ පොලට සුදුසු නිෂ්පාදන තත්ත්වයක් ඇති කර ඇත්තේ පලතුරු දෙකකට, පැෂන් ෆෲට් හා අන්නාසි.)

මේ කරුණු නිසා අපේ පලතුරු වගාව දේශීය ඉල්ලුම වැපිරීම මූලික අරමුණු කරගෙන දියුණු කළ හැකියි. උදහරණයක් ලෙස: මෙතෙක් කිරි නිෂ්පාදනයට යොමු කළ පැපොල් පළතුරු වැවිල්ලක් ලෙසත් කළ හැකියි.

තවත් අරමුණක්ද මෙම වැඩපිළි වෙළේ ඇතුළත්. ඒ පළතුරු ආශ්‍රිත කර්මාන්ත බිහි කිරීම. යම් ප්‍රදේශයක් එක් පළතුරක් විශාල වශයෙන් වැවූ පසු එම ප්‍රදේශයම පලතුරු ඇසිරීමේ, සකස් කිරීමේ කම්හල් බිහි කළ හැකියි. එයින් පළතුරු අපතේ යාම නවතින අතර, රැකියා සුලභකිරීම, විදේශ විනිමය උපයීම ආදී පරමාර්ථයක් රැසක් ද ඉටු වෙනවා. මෙබඳු වැඩ පිළි



වෙලක් තුළින් ජනතාවගේ පෝෂණ තත්ත්වය දියුණු කිරීමටත් හැකි බවයි හේරත් මහතාගේ අදහස. අපේ ජනතාව පලතුරු ආහාරයට ගන්නේ අමිශ්‍රව, උද: යම් පලතුරු යූෂක් සකස් කලත් එයට වෙනත් පලතුරක් තබා දෙහි හෝ දෙඩම් බිංදු කිහිපයක් මිශ්‍ර කිරීමටත් අපේ ජනතාවට නුහුරුයි. ඒ නිසා රසය හා ගුණය ප්‍රගුණ කරන පලතුරු යූෂ මිශ්‍ර කිරීමටත් අපේ ජනතාවට නුහුරුයි. ඒනිසා රසය හා ගුණය ප්‍රගුණ කරන පලතුරු යූෂ මිශ්‍රන ජනතාවට පහසු මිළට ලබාදීම මෙම වැඩ පිළිවෙලේ තවත් අරමුණකි.



මේ අරමුණින් මෙම පලතුරු වගා කිරීමේ සහනාධාරය දිවයිනේ සුදුසුම ප්‍රදේශ කිහිපයකට සීමා කිරීමට බලාපොරොත්තු වූවත් එයට ඉඩක් ලැබුනේ නෑ. ඒ සෑම දිස්ත්‍රික්කයකින්ම ඒ සහනා ධාරයට ඉතා තියුණු ඉල්ලීමක් ඇති වීමෙන් (අක්කර 10,000 ක් පළතුරු වගා කිරීමේ විසි අවුරුදු ඉලක්කය දැනටම සම්පූර්ණ වෙලා. එසේ වූවත් මෙම වැඩ පිළිවෙල යටතේ පළතුරු ගොවීන්ට සපයන පහත සඳහන් මුදල් ප්‍රමාණයන් පළතුරු අක්කර යක් වගා කිරීමට ලබාගත හැකියි. දෙහි සඳහා රු. 2,800/– ක්, දෙඩම් රු. 2,500/– ක්, පැෂන් ෆෲට් රු. 4,000/–ක්, කෙසෙල්/මැංගුස්ටින් සඳහා රු. 2,000/–ක්, අලිගැට පේර රු. 2,250/– ක්, අන්නාසි රු. 3,500/– ක්, අඹ සඳහා රු. 1,750/– ක් හා රඹුටන් සඳහා රු. 1,500/– ක් වශයෙන්.

මෙම වැඩ පිළිවෙලින් අපේ රට පලතුරුවලින්ද ස්වයංපෝෂණ යක් කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශ යේ අදහසයි.